කොවිඩ්-19 ගෝලීය ව්‍යාප්ත වසංගතය පාලනය සම්බන්ධයේදී අවධානය යොමු කළ යුතු වැදගත් කරුණක් වන්නේ, කොවිඩ්-19 ආසාදිතයන් හා ආශ්‍රිතයන් පිළිබඳව සමාජ කොන් කිරීමක් ඇති වීම වැළැක්වීමයි. මන්දයත්, එසේ කොවිඩ්-19 ආසාදිතයන් පිළිබඳව ඇතිවන කොන් කිරීමක එක් ප්‍රතිඵලයක් වන්නේ ආසාදිතයන් රෝගය සැඟවීම සහ වෛද්‍ය ප්‍රතිකාර හා නිරෝධායනය සඳහා යොමු නොවීමයි.

මෙසේ කොවිඩ්-19 ආසාදිතයින් සම්බන්ධයෙන් සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයක් ඇති කිරීමට ඇතැම් මාධ්‍ය වාර්තාකරණයන්ගෙන් ලැබෙන දායකත්වයද නොතකා හැරිය නොහැක.

උදාහරණ ලෙසින්, "කොරෝනා කත", "කොරෝනා පියා", "කොරෝනා රාළහාමි", "කොරෝනා යාචකයා", "කොරෝනා සිරකරුවා", "කොරෝනා මව්වරු", "කොරෝනා සේවකයා", "කොරෝනා රියදුරු" වැනි යෙදුම් පුවත් වාර්තාවන් තුළ භාවිතා වීම දැක්විය හැක. මෙවන් යෙදුම් කෙතරම් ශිෂ්ට සම්පන්න වන්නේද, පුද්ගල ගරුත්වයට හානි පමුණුවන්නේද යන්න සාකච්ඡාවට ලක් විය යුතු අතරම, එවන් යෙදුම් ඔස්සේ කොවිඩ්-19 ආසාදිතයන් කෙරෙහි ඇති විය හැකි සමාජ කොන් කිරීම සම්බන්ධයෙන්ද මාධ්‍ය සවිඥාණික විය යුතු වෙයි. ශිෂ්ට සම්පන්න සමාජ චින්තනයක් උදෙසා ශිෂ්ට සම්පන්න භාෂාවක් ඉවහල් වන අතර, එහිලා මාධ්‍ය අත ප්‍රධාන වගකීමක් රැඳෙන බවද සිහිපත් කිරීම වටී.

පහත දැක්වෙන්නේ එවන් යෙදුම් ඔක්තෝබර් 24 සිට නොවැම්බර් 24 දක්වා කාලය තුළ තෝරාගත් සිංහල භාෂා පුවත්පත් තුළ යෙදී තිබූ වාර ගණනයි.

මේ සම්බන්ධයෙන් අප පෙර පළ කරන්නට යෙදුණු දත්ත සටහනට ප්‍රවේශය මෙතැනින්: **https://www.facebook.com/.../a.23402.../1283497382005316/...**

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #NewsPapers #Divaina #SundayDivaina #Mawbima #SundayMawbima #Lankadeepa #SundayLankadeepa #Dinamina #Silumina #Aruna #SathiAgaAruna**